## Abstract 29

# බුද්ධකාලීන භික්ෂු සංස්ථාවට සාපේක්ෂව නූතන භික්ෂු සමාජය පිළිබඳව කෙරෙන තුලනාත්මක අධ්‍යයනයක්


**ඊ. යූ. පී. චන්දිමා පතිරණ,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර - බෞද්ධ සංස්කෘතිය),
*pathiranachaandi@gmail.com*



මෙම පර්යේෂණය මූලික වශයෙන් අයත් වන්නේ බෞද්ධ සම්ප්‍රදායයේ එන බෞද්ධ භික්ෂු සමජය නම් විෂය ක්ෂේත්‍රයට යි. බුද්ධ කාලීන හා නූතන භික්ෂු සංස්ථාව අතර කැපී පෙනෙන වෙනස්කම් කවරේ ද යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ යි. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ නූතන භික්ෂු සමාජයේ ඇතැම් අවභාවිතයන් බුද්ධකාලීන භික්ෂු සමාජයේ ද පැවතියේ නම් එය සමාජ විද්‍යාත්මක සහ පුද්ගලබද්ධ සංසිද්ධියක් වන බවත් මේ පිළිබඳ සවිඥානක වීමේ හා ඊට බුද්ධකාලයේ මෙන් ම පිළියම් යෙදීමේත් ක්‍රමවේදයක් ඇද්ද යන්න යි. භික්ෂු සංස්ථාව වූ කලී අනුක්‍රමයෙන් විකාශය වෙමින් ශක්තිමත් සංස්ථාවක් බවට පත් වූවකි. එය ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිත්වයෙහි පිහිටා නිවන් අවබෝධය පිණිස කටයුතු කිරිමට කැප වූ සංස්ථාවක් වේ. බුද්ධකාලීන භික්ෂු සමාජය නිර්වාණ මූලික ප්‍රතිපදාවක නිරත වූ බව පැහැදිලි කරුණකි. වර්තමාන භික්ෂු සමාජයේ ද මෙය පැවිද්දේ ප්‍රතිඥාව වන අතර, ඒ සඳහා පිළිපැදීම් දක්නා ලැබේ. බුද්ධකාලීන භික්ෂු සමාජයේ ද ඡබ්බග්ගිය, සත්තරසවග්ගිය භික්ෂු භික්ෂුණීන්ගේ දුෂ්ප්‍රතිපත්තීන් පැවති අතර වර්තමාන භික්ෂු සංස්ථාවේ ද විවිධ අවභාවිතයන් දක්නා ලැබේ. මෙහි දී දැකිය හැකි විශේෂ කරුණ වන්නේ ප්‍රමාණමය වශයෙන් පරස්පරතාව යි. තව ද බුද්ධකාලීන භික්ෂු සංවිධානය තුළ වරදට බුදුන් වහන්සේ විසින් පෙන්වා දෙන ලද ධර්මනීතිය විධිමත් ලෙස ක්‍රියාත්මක වීමක් දක්නට ලැබුණු අතර, වර්තමානයේ ධර්මනීතිය වෙනුවට රාජනීතිය කෙරෙහි අවධානය යොමුවීමක් දක්නා ලැබේ. අනෙක් අතින් වර්තමාන භික්ෂු චර්යාවෙහි බුදුන් වහන්සේ විසින් පෙන්වා දෙන ලද ආත්මීය ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලියේ ලිහිල් වීමක් දක්නා ලැබේ. කෙසේ වෙතත් භෞතිකත්වය ම අගයන සමාජයක නූතන භික්ෂු පරපුරෙහි නිර්වාණ මූලික චර්යාවන් සහිත භික්ෂූන් ද සංඛ්‍යාත්මක වශයෙන් අඩුවෙන් වුව ද දක්නට ලැබීම භාග්‍යයක් කොට සැලකිය හැකි ය.



**ප්‍රමුඛ පද :** දුෂ්ප්‍රතිපත්ති, ධර්ම නීතිය, බුද්ධ කාලය, භික්ෂු විනය, භික්ෂූ සමාජය